// Sri Lanka Gazette
# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2286/15 - 2022 ජුනි මස 27 වැනි සඳුදා - 2022.06.27**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංක - IR/COM/02/2019/127.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4 (1) වගන්තිය යටතේ 2020.07.08 දිනැති හා අංක 2183/30 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2020.04.03 දින දරන නියෝගයෙන්, එක් පාර්ශවයක් වශයෙන් බොරලැස්ගමුව, අබේරත්න මාවත, 1 වන පටුමග, අංක 44/50 හි පදිංචි එච්. ටී. මධූ තුෂාන්ති මිය සහ කොළඹ 05, නාරාහේන්පිට, නාවල පාර, අංක 161හි පිහිටි චාටර් හවුස් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2022.05.24 දිනැති ප්‍රදානය එම පනතේ 18 (1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 ජුනි මස 09 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

1A - G 37009 — 15 (2022/06)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www. documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංක - IR/COM/02/2019/127.

කොළඹ කාර්මික අධිකරණයේ දී ය.

එච්. ටී. මධු තුෂාන්ති මිය,
නො. 44/50,
1 වෙනි පටුමග,
අබේරත්න මාවත,
බොරලැස්ගමුව.

එදිරිව

A/40/2020

චාටර් හවුස් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්,
නො. 161,
නාවල පාර,
නාරාහේන්පිට,
කොළඹ 05.

ප්‍රදානය

නිපුණතා සංවර්ධන රැකී රක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍ය ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් විශේෂ ප්‍රතිපාදන පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් පැවැරී ඇති බලතල අනුව එකී ආරවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා 2020 අප්‍රේල් මස 03 දිනැති විශේෂයෙන් බේරුම්කරුවෙකු වශයෙන් මා පත්කොට මවෙත යොමුකර ඇත.

**ආරවුලට තුඩුදුන් කාරණය**

බේරුම්කරණයට මා වෙත යොමුකර ඇති උක්ත නියෝගය ප්‍රකාරව ඉහත සඳහන් දෙපාර්ශවය අතර උද්ගත වී ඇති කාර්මික ආරවුලට හේතු වී පවතින කාරණය ලෙස කම්කරු කොමසාරිස් ජනරාල් ඒ. විමලවීර මහතා විසින් 2020 පෙබරවාරි මස 13 වන දිනැතිව එවා ඇති ලිපියේ දැක්වෙන්නේ චාටර් හවුස් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයේ සේවය කළ එච්. ටී. මධු තුෂාන්ති මහත්මියට ප්‍රසාද දීමනාව, දිරි දීමනාව ලබා නොදීමෙන් අසාධාරණයක් සිදුව තිබේ නම් ඇයට හිමි විය යුතු සහන කවරේද යන්න පිළිබඳව වේ.

මෙම යොමුවට අනුව ආරවුල අදාළ පාර්ශවයන් වෙතින් ලිඛිත කරුණු ලබා ගැනීමෙන් අනතුරුව මෙකී නඩුව විභාගයට ගැනීමට තීරණය කරමින් 2020.11.18 දින නඩුව ආරම්භ කළ අතර සමථයක් තිබේදැයි විමසූ විට සමථයක් නොමැති බැව් ප්‍රකාශ වූයෙන් ඉල්ලුම්කාර පාර්ශවයට ලිඛිත කරුණු සැළ කිරීමට 2021.01.22 දිනට දින නියම කරන ලදී. දෙපාර්ශවයම දිවුරුම් ප්‍රකාශ මගින් කරුණු දැක්වීමට තීන්දු කරන ලදී.

ඉල්ලුම්කාරියගේ 2021.02.22 දිවුරුම් ප්‍රකාශයට වගඋත්තරකාර ආයතනය 2021.04.09 දින දිවුරුම් ප්‍රකාශයක් මගින් පිළිතුරු ලබා දෙන ලදී.

රටේ පැවති අයහපත් සෞඛ්‍ය වාතාවරණය මත 2022.01.05 දින නැවත මෙම ආරවුල විභාගයට ගත් අතර ඉල්ලුම්කාර පාර්ශවය මෙම ආරවුල සමථයකින් විසඳීම සඳහා රුපියල් එක් ලක්ෂ විසිදහසක (රු. 120,000) මුදලක් අපේක්ෂා කරන බැව් කියා සිටියේය. එම යෝජනාව අනුව වගඋත්තරකාර පාර්ශවය එම යෝජනාව කළමනාකාරීත්වය සමඟ සාකච්ඡා කිරීමට දින ඉල්ලා සිටියෙන් 2022.02.14 හා 2022.03.30 දෙදින ද, දෙපාර්ශවය සමථය පිළිබඳව වැඩිදුරටත් සාකච්ඡා කරන ලදී.

2022.05.19 දින නඩුව කැඳවූ අවස්ථාවේ පහත සඳහන් පරිදි දෙපාර්ශවය සමථයකට කැමැත්ත ප්‍රකාශ කරන ලදී.

නඩුව සමථයකට පත් කර ගැනීමක් ලෙස ආයතනයෙන් ලැබිය යුතු සියලු දීමනා වෙනුවෙන් රුපියල් ලක්ෂයක මුදලක් (රු. 100,000) ලබා ගැනීමට ඉල්ලුම්කාරිය වූ එච්. ටී. මධු තුෂාන්ති මහත්මිය කැමැත්ත ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව චාටර් හවුස් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ් හි මානව සම්පත් කළමනාකරු වජිර සේනානායක මහතා 2022.05.19 දිනැති NDB බැංකුව 483053 දරන රුපියල් ලක්ෂයක් (රු. 100,000) වටිනා චෙක්පත ඉල්ලුම්කාරිය වෙත ප්‍රදානය කරන ලදී.

මේ අනුව ඉහත පරිදි මෙම ආරවුල 2022.05.19 දින කොළඹ කාර්මික අධිකරණයේ දී සමථයකට පත්කර ගන්නා ලදී.

එහෙයින් මෙම සමථය සාධාරණ හා යුක්ති සහගත එකක් බවට මම තීරණය කරමි.

A. A. වීරසූරි,
බේරුම්කරු.

2022 මැයි මස 24 වැනි දින.

EOG 06-0202